**බලංගොඩ නගර සභාව - 2022**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බලංගොඩ නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ උපචිත වියදම් රු.1,315,430ක් හා කොම්පෝස්ට් තොගයේ වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | උපචිත වියදම් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව හා නිෂ්පාදන ගිණුමක් පිළියෙල නොකරන බැවින් අවසන් තොගය ගණනය නොකරන බව | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු වේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.504,274,940ක් වූ ගිණුම් ශේෂ 04ක් වෙනුවෙන් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවුණි. | මෙම වර්ෂය අවසන් වන විට උපලේඛන ඉදිරිපත් කිරීමට හැකි බව | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 සැප්තැම්බර් 29 දින අංක 01/2021 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.5 වගන්තිය පරිදි එකතුව රු.6,841,637ක් වූ කර්මාන්ත 10ක් ඒවා අයත් බල ප්‍රදේශයෙන් බැහැර ප්‍රජා පාදක සංවිධානවලට පිරිනමා තිබුණි. | වෙනත් වසමක ප්‍රජාපාදක සංවිධානයකට අදාළ කර්මාන්තය ලබා දීමට විරුද්ධත්වයක් නොමැති බවට අදාළ කර්මාන්තය පිහිටි වසමේ ප්‍රජාපාදක සංවිධාන දන්වා ඇති බව. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,227,487ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,063,975ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| ---------- | --------------- | ------ | ----------- | ------------- | --------------- | ------ | -------- | ----------- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 10,777,000 | 11,611,507 | 12,335,139 | 6,156,320 | 10,700,000 | 11,951,860 | 8,429,144 | 6,874,552 |
| කුලී | 36,096,000 | 35,675,467 | 34,481,551 | 860,427 | 38,729,000 | 29,003,597 | 31,208,785 | 1,551,806 |
| බලපත්‍ර ගාස්තු | 2,285,000 | 1,534,728 | 1,379,728 | - | 2,223,000 | 1,503,965 | 1,452,216 | - |
| වෙනත් ආදායම් | 27,030,000 | 24,701,612 | 24,957,583 | - | 22,143,000 | 20,990,067 | 18,375,765 | - |
| | 76,188,000 | 73,523,314 | 73,154,001 | 7,016,747 | 73,795,000 | 63,449,489 | 59,465,910 | 8,426,358 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂවලට අදාළ හිඟ වරිපනම් හා බදු රු.6,156,320ක් අයකරගෙන නොතිබුණු අතර, ඊට අදාළ කාල විශ්ලේෂණයක් ද සකස් කර නොතිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බවත් පවතින වරිපනම් වැඩසටහන යටතේ කාළ විශ්ලේෂණයක් සිදුකිරීමට නොහැකි බව. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ඉකුත් වර්ෂවලට අදාළ හිඟ කුලී ආදායම් රු.279,809ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකරගෙන නොතිබුණි. | අදාල හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ප්‍රදර්ශිත දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් නොකිරීම නිසා ඉන් ලැබිය යුතු ආදායම හඳුනාගත නොහැකි වී තිබුණි. එමෙන්ම, එක් දැන්වීම් පුවරුවක් වෙනුවෙන් රු.346,560ක් අඩුවෙන් අයකරගෙන තිබුණි. | 2023 වර්ෂයේ සමීක්ෂණය සිදුකරමින් පවතී. සභාපති තුමාගේ තීරණයක් මත 2022 වර්ෂයේ අයකිරීම් සිදු කිරීමෙන් සභාවට අහිමි වූ මුදල රු.346,560.00ක් බව. | වාර්ෂික සමීක්ෂණ සිදුකර ආදායම් අයකළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ටිකට්පත්වල වටිනාකම නොසලකා දින 10ක සැණකෙළියකින් විනෝද බදු ලෙස රු.500,000ක් පමණක් අයකර තිබුණි. එමෙන්ම, ක්‍රීඩාපිටිය හා ක්‍රීඩාගාරය සඳහා එම ගැසට් නිවේදනයට අනුකූලව ගාස්තු අය නොකිරීම නිසා රු.200,000ක ආදායමක් ද අහිමි වී තිබුණි. | සභා තීරණය අනුව කටයුතු කරමින් ගාස්තු අයකළ බව. | 2021 දෙසැම්බර් 03 දිනැති අංක 2257 දරන ගැසට් නිවේදනය පරිදි ගාස්තු අයකළ යුතු වේ. |

### 3.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභිකයින් දෙදෙනෙකු හා නිලධාරිනියක විසින් රාජකාරීමය නොවන ගමන් සඳහා රු.42,576ක ඉන්ධන වැය කර සභාවේ වෑන් රථය භාවිතා කර තිබුණි. | ඉදිරියට සභාව සතු වාහන පෞද්ගලික භාවිතයට නොගන්නා බව. | රාජකාරීමය නොවන ගමන් සඳහා රජයේ වාහන භාවිතා නොකළ යුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභා කාර්යාලය, සභා ආයුර්වේදය, කියවීම් ශාලාව, මහජන ක්‍රීඩාපිටිය හා ප්‍රේක්ෂකාගාරය පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගෙන නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | වත්කම්වල අයිතිය පවරා ගත යුතු වේ. |
| (ආ) | සභාව සතු බවට ලේඛනවල සඳහන් වන අක්කර 05 පර්චස් 35.44ක් වූ ඉඩම් භෞතික වශයෙන් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කර නොගත් ඉඩම් භෞතිකව හඳුනා ගෙන නිරවුල් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව. | වත්කම්වල අයිතිය පවරා ගත යුතු වේ. |
| (ඇ) | ක්‍රීඩා පිටියක් සඳහා 2020 පෙබරවාරි 18 දින රු.257,500කට මිලට ගන්නා ලද බල්බ් 50ක් හා 2019 හා 2020 වර්ෂවල දී ලද රු.128,375ක විදුලි උපාංග මේ දක්වාම අභාවිතව පැවැතුණි. | අනෙකුත් උපාංග සපයා ගැනීමට හැකි වූ පසු බල්බ භාවිතා කිරීම සිදු කරන බව. | අවශ්‍යතාවය හඳුනාගෙන භාණ්ඩ මිළදී ගැනීම් කටයුතු කළ යුතු වේ. |

### 3.4 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කම්පැක්ටරයක් සහ ගලි ටැංකියක් වසර 05කට වැඩි කාලයක සිට අභාවිතව දිරාපත් වෙමින් පැවතුණි. | ගලි ටැංකිය අබලි ද්‍රව්‍ය යටතේ බැහැර කිරීමට යොමු කර ඇති බව. | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතු වේ. |
| (ආ) | සභාව සතු නොවූ වාහන 06ක හිමිකාරීත්වය, පවරා ගැනීමට හෝ ආපසු භාර දීමට හෝ කටයුතු කර නොතිබුණි. | වාහන වල අයිතිය පවරා ගැනීමට අදාළ ලියකියවිලි ප්‍රධාන අමාත්‍යාංශයට යොමු කර ඇත. | අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ පරිදි කටයුතු කළ යුතු වේ. |

### 3.5 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ දී ගෝන මස් කිලෝග්‍රෑම් 10ක් ළඟ තබා ගැනීම හා 2022 වර්ෂයේ දී බ්‍රැන්ඩි ලීටර් 2.250ක් ගිණුම් ගත නොකිරීම නිසා අධිකරණය විසින් රු.125,000ක දඩයක් බලංගොඩ තානායම් පාලකට නියම කර තිබුණි. එකඟ වූ ගිවිසුම අනුව, නීතිවිරෝධි ක්‍රියාවක් කළහොත් බදු අයිතිය අහෝසි විය යුතු වුවද, 2023 වර්ෂය සඳහා ද ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව එම බදුකරුටම තානායම බදු දී තිබුණි. | මහ සභාවේ තීරණයක් මත මින් ඉදිරියට ගිවිසුම් කොන්දේසි කඩ කිරීමක් සිදු වුවහොත් තානායම සභාවට පවරා ගන්නා බවට දන්වා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සභාපතිවරයාගේ අභිමතය පරිදි අනවසර ගොඩනැගිලි 02ක් සඳහා සැලසුම් අනුමත කර අනුකූලතා සහතික නිකුත් කර තිබුණි. එම අනුමැතිය ලබාදීමේ දී සභාවට අයකර ගත යුතු ආදායම් රු.886,301ක් ද අත්හැර දමා තිබුණි. | අයදුම්කරුගේ ඉල්ලීම සලකා, මහ සභාවේ අනුමැතිය මත පදනම්ව සද්භාවයෙන් යුතුව ගොඩනැගිලි සැලසුම් අනුමත කර අදාළ සහතික ලබා දීමට කටයුතු කරන ලද බව. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම ඊට අදාළ නීති රීති හා රෙගුලාසි වලට අනුකූලව සිදුකළ යුතු වේ. |